# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1816/35 - 2013 ජුනි මස 28 වැනි සිකුරාදා - 2013.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රේගු නිවේදනයයි

රේගු ආඥාපනතේ (235 අධිකාරය) 111 වගන්තිය යටතේ වන නියෝගය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, රේගු ආඥාපනතේ (235 අධිකාරය) 111 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, කොළඹ වරාය, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වරායක් විය යුතු බව සහ එහි සීමාවන් මෙහි උපලේඛනයේ "අ" සිට "ඉ"දක්වා සඳහන් කර ඇති පරිදි විය යුතු බව මෙම නියමය මගින් නියම කර ප්‍රකාශයට පත් කරමි. තවද, උපලේඛනෙයේ සඳහන් කර ඇති ස්ථාන එහි සඳහන් සීමාවන් තුළ භාණ්ඩ සහ තැපැල් භාණ්ඩ, නැව්වලින් බෑම, ගොඩබෑම, ගුදම් ගත කිරීම, අපනයනය කිරීම, ප්‍රතිඅපනයනය කිරීම, සංක්‍රමණික භාණ්ඩ ආනයනය හා අපනයනය, අන්තරාල භාණ්ඩ සහ බහාලුම් සම්බන්ධයෙන් කටයුතු කිරීම, මගීන් නැව්වලින් ගොඩ බැස්සවීම සහ නැව්වලට නංවා ගැනීම, කොළඹ වරාය ඇතුළත සිදු කරන බව තවදුරටත් ප්‍රකාශය පත් කරමි.

මහින්ද රාජපක්ෂ,
ජනාධිපති,
(මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය).

2013ක් වූ ජුනි මස 28 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ දී ය.

### රේගු ආඥාපනතේ 111 වගන්තිය යටතේ වරායක් පිළිබඳ ගැසට් නිවේදනය

අ. පහත දැක්වෙන පරිදි මායිම් වූ ප්‍රදේශය :-

*උතුරට :* මෝදර තුඩුවේ සිට නාවික සැතපුම් 1.54ක් ඇතින් 027 දරන "ඒ " ලක්ෂයේ සිට 275 දෙසට නාවික සැතපුම් 6.5ක දුර ප්‍රමාණයක් දක්වා අඳින ලද රේඛාවක් මගින්

1A - G 17900— 335 (2013/07)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*දකුණට* : 165.5 ක දිසාවකට ගල්බොක්ක ලක්ෂ්‍යය අසල වූ කොඩිගහ සිට නාවික සැතපුම් 6ක් දුරින් පිහිටියා වූ මුහුදු වෙරළේ වඩදිය ලකුණෙහි "වයි" යන වෙනත් ලක්ෂ්‍යයකට බස්නාහිරෙන් නාවික සැතපුම් 3ක් දුරින් පිහිටියා වූ "බී" ලක්ෂ්‍යයක සිට ද එතැන් සිට "බැටන්බර්ග් " බැටරියේ උතුරු සහ නැගෙනහිර මායිම් තාප්පය ඔස්සේ "ගොල්බක් " දුම්රිය ගේට්ටුව දක්වා ඒ ගේට්ටුව ඔස්සේ සහ එතැන් සිට කොමසාරිස් වීදියේ තාප්පය ඔස්සේ ආණ්ඩුවේ ගබඩාවල වයඹ දෙස මුල්ලට ද, එතැන් සිට කොමසාරිය වීදියේ ආණ්ඩුවේ ගබඩා ගොඩනැගිලිවල උතුරු සහ නැගෙනහිර පැති ඔස්සේ කොමාසාරියට් ගේට්ටුවට ද, කොමසාරියට ගේට්ටුව කෙලින් ඒ ඔස්සේ ශ්‍රී ලංකා රේගු ගොඩනැගිල්ලේ බිත්තියට ද එතැන් සිට රේගුවේ දකුණු පැත්ත සහ ශ්‍රී ලංකා වරායවල් පිළිබඳව අධිකාරියේ කාර්යාල සහ ගරාජ් ඔස්සේ ද, එතැන් සිට පල්ලිය වීදියේ උතුරු මායිම් තාප්පය ඔස්සේ රේගු මන්දිරයට ඇති ප්‍රවේශය ඉදිරිපිට පාර හරහා වූ රැඳවුම් තාත්පය කෙලින්, ඒ ඔස්සේ ලේඩින් බැස්ටියන් ගේට්ටුවට ද, ලේඩින් බැස්ටියන් ගේට්ටුව ඔස්සේ ලේඩින් බැස්ටියන් පාරේ උතුරු මායිම් තාප්පය ඔස්සේ (බේරේ) වැවේ බටහිර ජැටියට සහ වරාය ඇළට ද, එතැන් සිට කෙළින් වීදියේ පාලමේ බස්නාහිර තාප්පය ඔස්සේ කෙළින් වීදියේ දකුණු මායිම් තාප්පයට ද, එතැන් සිට කෙළින් වීදියේ දකුණු තාප්පය ඔස්සේ සහ ලෝටස් පාරේ නැගෙනහිර මායිම් තාප්පය සහ නොරිස් පාරේ උතුරු මායිම් තාප්පය ඔස්සේ බේරේ වැවේ බස්නාහිර වේදිකාවට, වරාය ඇළට එතැන් සිට බේරේ වැවේ බස්නාහිර වේදිකාව ඔස්සේ වරාය ඇළට, නෝරිස් පාරේ  පාළමේ නිරිත දෙසට නෙරාගිය කොටසට සහ එතැන් සිට අඩි 20ක් ඔබ්බෙන් ටගරම් වැට ඔස්සේ සහ ඇළේ බස්නාහිර වේදිකාවට සමාන්තරව දුම්රිය පාළමේ වයඹ දෙසට නෙරාගිය කොටසට සහ එතැන් සිට බස්නාහිර වේදිකාව ඔස්සේ දුම්රිය පාළමේ දකුණු පැත්තේ වූ දුරිය මායිම ඡේදනය වන ලක්ෂ්‍යකට ද එතැන් සිට දුම්රිය මාර්ගයේ දකුණු පැත්තේ දුම්රිය මායිම ඔස්සේ කොම්පඤ්ඤවීදිය දෙසට දළ වශයෙන් අඩි 100ක් වූ ලක්ෂ්‍යකට ද, එතැන් සිට පහළ මැකලම් පාර හරහා සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති සමාගමේ ස්ථානයේ මායිම් තාප්පයට ද, එතැන් සිට සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ස්ථානයේ උතුරු සහ නැගෙනහිර මායිම් ඔස්සේ මුදුන් පාළම දක්වා ද, එතැන් සිට මුදුන් පාළමේ බස්නාහිර පැති තාප්පය ඔස්සේ සහ පාරේ බස්නාහිර ගැටි බැම්ම පාර්සන් පාරේ නැගෙනහිර මායිම් තාප්පය දක්වා ද, එතැන් සිට පාර්සන් පාරේ මායිම් තාප්පය ඔස්සේ ඇළේ උතුරු වේදිකාව දක්වා ද, එතැන් සිට ඇළෙහි වේදිකාව ඔස්සේ දුම්රිය පාළම දක්වා ද, එතැන් සිට ගාලු මුවදොර වැවේ උතුරු, බස්නාහිර සහ දකුණු වරාය වේදිකා තාප්ප ඔස්සේ දකුණු වරාය වේදිකාවේ නැගෙනහිර කෙළවර දක්වා ද, එතැන් සිට බස්නාහිර වැවේ බස්නාහිර පැත්ත ඔස්සේ වැව කෙළවර සැකසෙන කොන්ක්‍රීට් තහඩු ඔස්සේ කොම්පඤ්ඤවීදියේ බ්‍රිජ් විදියේ පාළම දක්වා ද, එතැන් සිට බ්‍රිජ් වීදියේ පාළමේ බස්නාහිර තාප්පය ඔස්සේ සහ බස්නාහිර වැවේ බස්නාහිර පැත්ත ඔස්සේ වැව් කෙළවර සැකසෙන කොන්ක්‍රීට් තහඩු ඔස්සේ ජෙනරාල්ස් ලේක් පාර දක්වා ද, එතැන් සිට ජෙනරල්ස් ලේක් පාරේ බස්නාහිර පැත්ත සහ ගෝර්ඩන් පාරේ දකුණු පැත්ත සහ බස්නාහිර වැවේ නැගෙනහිර පැත්තේ වැව් කෙළවර ඔස්සේ වැව් කෙළවර සැකසෙන කොන්ක්‍රීට් තහඩු ඔස්සේ බ්‍රිජ් වීදියේ පාළම ක්වා ද, එතැන් සිට බ්‍රිජ් වීදියේ පාළමේ නැගෙනහිර පැත්ත ඔස්සේ සහ වැව කෙළවර සැකසෙන කොන්ක්‍රීට් තහඩු ඔස්සේ දුම්රිය පාරේ පාළම දක්වා ද, එතැන් සිට දුම්රිය පාළමේ දකුණු තාප්පය, වේදිකාව සහ පාර්සන් පාරේ පාළමේ දකුණු තාප්පය සහ වේදිකාව ඔස්සේ කලම්බු රෝවිං සමාජය ගොඩනැගිල්ල ඉදිරිපිට වේදිකාවේ කෙළවර දක්වා ද, එතැන් සිට නැගෙනහිර වැවේ බස්නාහිර පැත්තේ වැව කෙළවර සැකසෙන කොන්ක්‍රීට් තහඩු ඔස්සේ යුද්ධ හමුදා මූලස්ථාන කම්හල් ගොඩනැගිල්ලේ නැගෙනහිර මායිම් වැව දක්වා ද, මෝර්ගන් පාර හරහා මෝර්ගන් පාරේ දකුණු පැත්ත සහ කිව් පොයින්ට් පාරේ උතුරු පැත්ත ඔස්සේ පාර්සන් පාර දක්වා ද, එතැන් සිට පාර්සන් පාරේ නැගෙනහිර පැත්ත ඔස්සේ කිව් පොයින්ට් පාරේ දකුණු පැත්ත හමුවන ලක්ෂ්‍යයක් දක්වා ද, එතැන් සිට කිව් පොයින්ට් පාරේ සහ මෝර්ගන් පාරේ දකුණු පැත්ත ඔස්සේ කොම්පඤ්ඤ වීදියේ කිව් පොයින්ට් හි ලංකා පොලිස් ස්ථානයේ නැගෙනහිර මායිම් වැට දක්වා ද, එතැන් සිට ලංකා පොලිස් ස්ථානයේ නැගෙනහිර මායිම් වැට ඔස්සේ වැව කෙළවර සැකසෙන කොන්ක්‍රීට් තහඩු දක්වා ද, එතැන් සිට වැව් කෙළවර සැකසෙන කොන්ක්‍රීට් තහඩු ඔස්සේ නැගෙනහිර වැවේ බස්නාහිර පැත්ත ඔස්සේ හයිට් (පාර්ක්) උද්‍යානයේ උතුරු කෙළවර වැව කෙළවර දක්වා ද, අඳින ලද රේඛාවක් මගින් :

*නැගෙනහිරට* : වැව කෙළවර සැකසෙන කොන්ක්‍රීට් තහඩු ඔස්සේ සීමාසහිත හැරිසන්ස් ඇන්ඩ් ක්‍රොස්පීල්ඩ් සමාගමේ ගොඩනැගිලි ඉදිරිපිට වරාය තාප්පයේ දකුණු කෙළවරව දක්වා වූ දකුණු මායිමේ නැගෙනහිර අන්තය වශයෙන් ඉහත සඳහන් කොම්පඤ්ඤ්වීදියේ හයිඩ් පාර්ක් හි වැව කෙළවර වූ ලක්ෂ්‍යකට සිට ද, එතැන් සිට වේදිකාවේ ඔස්සේ වේදිකා බැම්මේ උතුරු කෙළවර දක්වා ද, වැව කෙළවර සැකසෙන කොන්ක්‍රීට් තහඩු ඔස්සේ නැගෙනහිර වැව උතුරු පැත්තේ වේදිකාවේ නැගෙනහිර කෙළවර දක්වා ද, එතැන් සිට වේදිකාව ඔස්සේ සැන්සෙබස්තියන් ඇළේ නැගෙනහිර පැත්තේ පෙරලා වේදිකාව දක්වා ද, එතැන් සිට ඇළේ වේදිකාව සහ කැළණි මිටියාවත් සහ ප්‍රධාන මාර්ග ද්‍රෝණිය ඔස්සේ නොරිස් පාරේ පාළම දක්වා ද, එතැන් සිට නොරිස් පාරේ පාළමේ පැති තාප්පය ඇළේ වේදිකාව, කපොලු දොරටුව සහ සැන්සෙබස්තියන් හිල් පාර ඔසසේ සැන්සෙබස්තියන්හි පිහිටි වරාය කොමිෂන් සභාවේ පොම්පකරන ස්ථානයේ නැගෙනහිර මායිම් වැවට ඡේදනය කෙරෙන වරාය වේදිකාවේ ලක්ෂ්‍යයක්  දක්වා ද, එතැන් සිට ඇළ සහ ජලය පොම්ප කරන ස්ථානයේ නැගෙනහිර මායිම් වැට, උතුර මායිම් තාප්පය සහ ජලය පොම්පකරන ස්ථානයේ බස්නාහිර මායිම් වැට හරහා ජලය පොම්ප කරන ස්ථානයේ බස්නාහිර මායිම් සමග පේළියට සිටිනසේ වරාය වේදිකාවේ ලක්ෂයක් දක්වා ද, එතැන් සිට සැන්සෙබස්තියන් හිල් පාරේ වූ පාළමේ උතුරු පැති  තාප්පය ඔස්සේ දොරටුව උතුරු පැත්තේ වේදිකාව ඔස්සේ නොරිස් පාරේ පාළම දක්වා ද, එතැන් සිට වරාය වේදිකාවේ පතුල්පිටිය, ප්‍රධාන මාර්ගයේ ද්‍රෝණිය ඔස්සේ පෙරළා ඇළේ වේදිකාව දක්වා ද, එතැන් සිට වරාය වේදිකාවේ බැම්ම ඔස්සේ බොයිස් බ්‍රදර්ස් සමාගමේ නැගෙනහිර මායිම් තාප්පයේ පේළියට හමුවන වරාය වේදිකා තාප්පයේ ලක්ෂ්‍යයක් දක්වා ද, බොයිස් බ්‍රදර්ස් සමාගමේ ස්ථානයේ නැගෙනහිර සහ උතුරු මායිම් තාප්පය ඔස්සේ නැගෙනහිර ඇළ දොර නැගෙනහිර තාප්පය දක්වා ද, එතැන් සිට මැකලම් පාර යට පාළමේ නැගෙනහිර තාප්පය ඔස්සේ මැකලම් පාරේ උතුරු මායිම්

තාප්පය දක්වා ද, එතැන් සිට නැගෙනහිර දෙසට වූ මැකලම් පාරේ උතුරු තාප්පය ඔස්සේ පෙරලා තාප්පය දෙසට ද එතැන් සිට කොටුව දුම්රිය ස්ථානයට ප්‍රවේශවීමේ බස්නාහිර මායිම් තාප්පය ඔස්සේ ඇළ දොර ද්‍රෝණියේ උතුරු පැත්තේ ටගරම් වැට දක්වා ද, එතැන් සිට ඇල දොර ද්‍රෝණියේ උතුරු පැත්තේ ටගරම් වැට ඔස්සේ දුම්රිය සඳහා වෙන්කළ ප්‍රදේශයේ දකුණු පැත්ත ඡේදනය වන ලක්ෂ්‍යයක් දක්වා සහ දුම්රිය සඳහා වෙන්කළ ප්‍රාදේශය සිට වරාය වේදිකා තාප්පය දක්වා ද, එතැන් සිට දුම්රිය පාළමේ නැගෙනහිර තාප්පය ඔස්සේ දුම්රිය සඳහා වෙන් කළ ප්‍රදේශයේ උතුරු පැත්ත ඡේදනය වන ලක්ෂ්‍යයක් දක්වා ද, එතැන් සිට දුම්රිය සඳහා වෙන්කළ ප්‍රදේශයේ ටගරම් වැට ඔස්සේ කටුකම්බි වැට ඡේදනය වන ලක්ෂයක් දක්වා ද, එතැන් සිට කටුකම්බි වැට ඔස්සේ නොරිස් පාරේ පාළමේ දකුණු තාප්පය දක්වා ද, නොරිස් පාරේ පාළමේ දකුණු තාප්පය ඔස්සේ වරාය වේදිකාව තාප්පය දක්වා ද, එතැන් සිට නොරිස් පාරේ පාළමේ නැගෙනහිර තාප්පයේ ඔස්සේ නොරිස් පාරේ පාලමේ උතුරු ආධාර බැම්ම දක්වා ද, එතැන් සිට කෙළින් වීදියේ උතුරු මායිම් තාප්පය ඔස්සේ චාමර්ස් වරයා වේදිකාව දක්වා ඇති දුම්රිය පාරේ බස්නාහිර පැත්තේ දුම්රිය ගේට්ටු කණුව දක්වා ද, එතැන් සිට කොළඹ මහනගර සභාවේ වැසිකිළියේ නැගෙනහිර දකුණු සහ බස්නාහිර මායිම් සහ බෝධිය සහ විහාර ස්ථානයේ ඔස්සේ කෙළින් වීදියේ උතුරු මායිම් තාප්පය දක්වා, එතැන් සිට කෙළින් වීදියේ දකුණු මායිම් තාප්පයේ සිට ඇළේ වේදිකාව දක්වා ද, එතැන් සිට කෙළින් වීදියේ පාළමේ නැගෙනහිර තාප්පය ඔස්සේ කෙළින් වීදිය පාළමේ උතුරු ආධාර බැම්ම දක්වා ද, එතැන් සිට කෙළින් වීදියේ උතුරු මායිම් තාප්පය ඔස්සේ කෙළින් විදීය හරහා වූ දුම්රිය ගේට්ටුවේ උතුරු කණුව දක්වා ද, එතැන් සිට දම්වැල් බාධකය ඔස්සේ රෙක්ලමේෂන් පාර හරහා වූ දුම්රිය ගේට්ටුවේ උතුරු කණුව දක්වා ද, එනැත් සිට වරාය ඉංජිනේරුවරයාගේ දෙපාර්තමේන්තුවේ වෙලාව තැබීමේ කාර්යාල ගොඩනැගිල්ලේ නිරිතදිග මුල්ල දක්වා සෘජු රේඛාවකින් ද, එතැන් සිට ඉහත කී වේලාව තැබීමේ කාර්යාල ගොඩනැගිල්ලේ දකුණු පැත්ත ඔස්සේ සහ රෙක්ලමේෂන් පාරේ සහ වෙරළබඩ පාර ඔස්සේ කොච්චිකඩේ ගේට්ටුව දක්වා ද, එතැන් සිට ශාන්ත අන්තෝනි දේවස්ථානයේ දකුණු, බස්නාහිර සහ උතුරු පැති ඔස්සේ කොර්ටිබෝම් විදියේ බස්නාහිර මායිම් සංයුක්ත වන ටගරම් වැට දක්වා ද, ටගරම් වැට ඔස්සේ ශාන්ත ජූඩ්ගේ ගේට්ටුව දක්වා ද, එතැන් සිට කොච්චිකඩේ ගේට්ටුව කෙලින් ඒ ඔස්සේ සහ කොර්ටිබෝම් වීදියේ බස්නාහිර මායිම සංයුක්ත වන මායිමේ වැට ඔස්සේ ටැන්ක් සල්ගාදු ගේට්ටුව දක්වා ද, එතැන් සිට ටැන්ග් සල්ගාදු ගේට්ටුව කෙලින් ඒ ඔසසේ සහ අලුත් මාවත පාරේ බස්නාහිර මායිම සංයුක්ත වන අඩි 10ක් උසැති යකඩ ගේට්ටුව ඔස්සේ කොළඹ වරාය කොමිෂන් සභාවේ පොල්තෙල් ගබඩාවල දකුණු ප්‍රවේශයේ එක් එක් ගේට්ටුව දක්වා ද. එතැන් සිට අලුත් මාවත පාරේ බස්නාහිර බාධකය සංයුක්ත වන දම්වැල් බාධකය ඔස්සේ ශ්‍රී ලංකා වරායවල් පිළිබඳ අධිකාරියේ පොල්තෙල් ගබඩාවේ උතුරු ප්‍රවේශයේ ඉහත කී වැට දක්වා ද, එතැන් සිට අඩි 10ක් උසැති යකඩ ගේට්ටුව ඔස්සේ සහ අලුත් මාවත පාළමේ බස්නාහිර තාප්පය ඔස්සේ සහ ඉහත කී වැට ඔස්සේ ධීවරයන්ගේ නිවාසවල දකුණු පැත්තෙහි වූ කොළඹ මහ නගර සභාවේ වැසිකිළිය දක්වා ද, එතැන් සිට කොළඹ මහ නගර සභා වැසිකිළියේ නැගෙනහිර සහ දකුණු බිත්ති ඔස්සේ ධීවරයන්ගේ නිවාසවල දකුණු මායිම සංයුක්ත වන මායිම් බිත්තිය දක්වා ද, එතැන් සිට ධීවරයන්ගේ නිවාසවල දකුණු මායිම් බිත්තිය ඔස්සේ පීෂරීස් හිල් පාරේ දකුණු පැත්තේ ටගරම් වැට දක්වා ද, එතැන් සිට ටගරම් වැට ඔස්සේ සහ පීෂර්ස් හිල් පාරේ දකුණු මායිම සංයුක්ත වන තාප්පය ඔස්සේ පිෂර්ස් හිල් ගේට්ටුව  දක්වා ද, එතැන් සිට පිෂර්ස් හීල් ගේට්ටුව කෙලින් සහ පිෂර්ස් හිල් පාරේ උතුරු තාප්පය සහ බස්නාහිර මායිම් තාප්පය සහ රොක් හවුස් පටුමග වැට ඔස්සේ "වුඩ්ලන්ඩ්ස් " යනුවෙන් හැඳින්වෙන ස්ථානයේ ඊසාන දිල මුල්ලේ වැටෙහි නැම්මෙහි වූ ලක්ෂයක් දක්වා ද, එතැන් සිට රොක් හවුස් පටුමග කෙළවර හරහා රොක්හවුස් බැටරි භූමියේ පිහිටියාවූ බස්නාහිර මායිම දක්වා ද, එතැන් සිට රොක්හවුස් බැටරියේ බස්නාහිර මායිම ඔස්සේ සහ මෝදර තුඩුවේ ගලකයේ දකුණු පැත්ත ඔස්සේ සහ සිට රොක්හවුස් බැටරියේ උතුරු මායිම් ඔස්සේ පිෂර්ස් හිල් පාර දක්වා ද, එතැන් සිට පිෂර්ස් හිල් පාරේ මායිම් වැට ඔස්සේ මාර්ෂල් විදීයේ දකුණු මායිම් ඔස්සේ සහ "ක්ලිප් හවුස් " නමැති ස්ථානයේ නැගෙනහිර සහ උතුරු මායිම් තාප්ප ඔස්සේ උතුරු වඩදිය ඉම ක්ලිෆ් හවුස් නමැති ස්ථානයේ උතුර මායිම් ඡේදනය වන ලක්ෂ්‍යයක් දක්වා ද, එතැන් සිට වඩදිය ඉම ඔස්සේ "X" යනුවෙන් ලකුණු කොට ඇත්තාවූ ලක්ෂයේ $206^0$ ක් දෙසින් වූ උතුරු මායිමේ අන්තය වන "ඒ " ලක්ෂ්‍යයට කෙළින්ම දකුණින් නාවික සැතපුම් 0.6ක් ඈතින් පිහිටියා වූ "X" යනුවෙන් වූ වෙනත් ලක්ෂ්‍යයක සිට අඳින ලද රේඛාවක් ඡේදනය වන මුහුදු වෙරළේ පිහිටියා වූ ලක්ෂ්‍යයක් දක්වා ද, එතැන් සිට සෘජු රේඛාවකින් "X"ලක්ෂ්‍යය දක්වා ද, එතැන් සිට "X" ලක්ෂ්‍යයට කෙළින්ම උතුරෙන් පිහිටි නාවික සැතපුම් 0.6ක් වූ "ඒ " ලක්ෂය දක්වා අඳින ලද රේඛාවක් මගින්,

*බස්නාහිරට :* උතුරු සහ දකුණු මායිම්වල බස්නාහිර අන්ත සම්බන්ධ කරන රේඛාවක් මගින්,

ආ. බිලු මැන්ඩල් තෙල් ගබඩාව යනුවෙන් හැඳින්වෙන ප්‍රදේශයේ මායිම් පහත දැක්වෙන පරිදි වන්නේ ය.

*උතුරට :* රජයේ ඉඩමෙන් සහ සී. එස්. ඇන්තනී මහතාට අයත් අලුත් මාවත පාරේ වරිපනම් අංක 478/1-28 සහ 28ඒ දරන ඉඩමෙන් ද බිලූමැන්ඩල් ස්ටෝර්ස්

*දකුණට :* වෝල්ස් පටුමගෙන්

*බස්නාහිරට :* අලුත් මාවත පාරේ වරිපනම් අංක 458 දරන "ඩිෂ් ඩෙනි" යනුවෙන් හැඳින්වෙන රජයේ ඉඩමෙන් සහ වරිපනම් අංක 47, වීදිය 59 සහ ගෙවත්ත 59 දරන පෞද්ගලික ඉඩමෙන්

ඇ. පහත දැක්වෙන සම්කක්ෂ ඍජු රේඛා මගින් සම්බන්ධ කිරීමේන උතුරට, දකුණට, නැගෙනහිරට සහ බටහිරට මායිම් වූ මීගමුවේ ජල ප්‍රදේශය.

*ප්‍රදේශ*

(අ) අක්ෂාංශ $07^0$ 15' උ
දේශාංශ $79^0$ 40' නැ
(ආ) අක්ෂාංශ $7^0$ 10' උ
දේශාංශ $79^0$ 41.5' නැ
(ඇ) අක්ෂාංශ $07^0$ 10' උ
දේශාංශ $79^0$ 48.5' නැ
(ඈ) අක්ෂාංශ $07^0$ 15' උ
දේශාංශ $79^0$ 47' නැ

(ඈ) පහත දැක්වෙන සම්කක්ෂ සම්බන්ධ ඍජු රේඛා මගින් සම්බන්ධ කිරීමෙන් උතුරට, දකුණට, නැගෙනහිරට සහ බටහිරට මායිම් වූ පානදුරයේ ජල ප්‍රදේශය ෑ

(අ) අක්ෂාංශ $06^0$ 43' උ
දේශාංශ $79^0$ 46.5' නැ
(ආ) අක්ෂාංශ $06^0$ 38' උ
දේශාංශ $79^0$ 48.5' නැ
(ඇ) අක්ෂාංශ $06^0$ 38' උ
දේශාංශ $79^0$ 53' නැ
(ඈ) අක්ෂාංශ $06^0$ 43' උ
දේශාංශ $79^0$ 51.5' නැ

ඉ, කොළඹ දකුණ වරායේ පළමු බහාලුම් අංගනය

ඉහත සඳහන් ඉඩම් සීමාවෙන් ප්‍රති බෙදීමක් වශයෙන් බී. ආර්. ආර්. පී. ජයසූරිය මානකගේ අංක L/S/P/327 සැලැස්මේ සැලසුම් ප්‍රකාරව සමාංක සහ 2011 අගෝස්තු මස 02 වැනි දින සැලැස්මේ ලොට් අංක 1 වශයෙන් (වරාය අධිකාරියට අයත් මුහුදු සහ ගොඩ ඉඩම්වල කොටසක් වශයෙන් වෙන්කර ඇති කොළඹ වරායේ කොළඹ දකුණ වරායේ පළමු බහාලුම් අංගනයට මායිම් ෑ

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සීමාව තුළ කොළඹ වරාය තුළ පිහිටි

*උතුරට* ෑ මුහුද ද,
*නැගෙනහිරට* ෑ මුහුද සහ කොළඹ වරායේ අධිකාරියට අයත් ගොඩ ඉඩම,
*දකුණට* ෑ ශ්‍රී ලංකා වරාය අධිකාරියට අයත් ගොඩ ඉඩම ද,
*බටහිරට* ෑ වරාය අධිකාරියට අයත් ගොඩ ඉඩම සහ මුහුද යන මායිම් තුළ පිහිටි අක්කර 144, රූඩ් 1, පර්. 1.82(අ. 144, රූ. 01, පර්. 1082) නොහොත් හෙක්ටයාර් අක්කර 58.3805කට සමාන බිම් ප්‍රමාණයක් තුළ පිහිටි කොළඹ වරායේ දකුණු බහාලුම් අංගනයේ මායිම් වේ.

07 - 541

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.